**සැළලිහිණි සන්දේශ කතුවරයාගේ ප්‍රතිභා පූර්ණ කවිත්වය මතු වන්නේ,**
**(අ) වර්ණනා චාතූර්යයත්**
**(ආ) උචිත උපමා යොදා ගැනීමත් නිසා ය.**
**එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.**

(අ) කෝට්ටේ සාහිත්‍ය යුගයේ දී රචිත සැළලිහිණි සන්දේශයෙහි කතුවරයාගේ ප්‍රතිභාපූර්ණත්වය මතු වන අවස්ථා බොහෝමයක් නිර්මාණය තුළින් ප්‍රතියමාන වේ. ඒ අතරින් අපූරු වර්ණනා චාතූර්යයත් එමෙන් ම උචිත උපමා භාවිතයත් විශේෂත්වයක් ගනී. ඒ, එමගින් කතුවරයාගේ ප්‍රතිභා පූර්ණ කවිත්වය කදිමට මතු වන බැවිනි. මේ වෑයම ඒ බව උචිත නිදසුන් ඇසුරෙන් තහවුරු කිරීමට ය.

දූත කාර්යයෙහි නියැලෙන දූතයාගේ ගමන් මග සැබවින් ම අපූර්වත්වයෙන් යුතු වූවකි. එහි දී හමුවන ස්ථාන නෙක සුන්දරත්වයෙන් අනූන වී ඇති බව රහල් හිමියෝ පවසති. ඒ වෙනුවෙන් උන්වහන්සේ අපූරු සංකල්පනාවන් යොදා ගත්තේ සිය වර්ණනා චාතූර්යය ප්‍රතිමූර්තිමත් කිරීමටයි. මේ ඉන් එක් අවස්ථාවකි.

"සුර රද සමන් සමඟින් සුරඟන එවර
පැහැ නද මදාරා පරසතු මල් පතර
කර පුද වඳින රැඳි මුනි සිරිපා තඹර
සකි සඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර"

සන්දේශය රැගෙන යන දූතයාට නැගෙනහිර පෙදෙසින් හමුවන්නේ උතුම් සිරිපාදය රැඳි සමනොළ පර්වතය යි. ඒ බව කවියා පවසන්නේ අපූරු සිදුවීමක් ද පැදියට නතු කරමින්ය. එනම් දෙවඟනන් පිරිවරාගත් සුමන සමන් දෙවිඳුන් මදාරා හා පරසතු මල් රැගෙන සිරිපාදය වන්දනා කරන බව දක්වන්නේ

බුද්ධාලම්භන ප්‍රීතියක් රසික හදවතේ ස්ථාපිත කරමිනි. සරල ව පැවසිය හැකි අවස්ථාවකට රසවත් සංකල්පනාවක් යෙදීම මගින් ගම්‍ය වන්නේ කවියාගේ වර්ණනා චාතුර්යයේ සුවිශේෂී බවයි. එයින් කතුවරයාගේ ප්‍රතිභා පූර්ණත්වය මැනවින් මතු වී ඇත.

සන්දේශය රැගෙන ගමන් ගන්නා මාර්ගයෙහි ස්වභාවික සම්පත් එමට ය. ඉන් සුවිශේෂී වූ ස්ථානයක් කවියා සිය වර්ණනා චාතුර්යය මගින් රූපණය කරවන්නේ සිය ප්‍රතිභාවය මැනවින් පිළිබිඹු කරමින්ය. පහත පැදිය ඒ වග තහවුරු කරයි.

"වළඳින අදහසින් මෙන් සුර ගඟ අඟන
නල බල සසල දළ රළ පෙළ නුබ නැගෙන
වෙළලස ගැවසි මුතු සක් පබලු බබලන
බල මහ මුහුද එම සඳ උතුරෙන් පෙනෙන"

අහස් ගංගාව නමැති ස්ත්‍රිය වැළඳ ගැනීමට උතුරු මුහුදේ රළ පෙළ ඉහළට එසවෙන බව කවියා දක්වයි. එහි දී වෙරළේ ඇති අමිල වූ සම්පත් රැසක් දැක ගත හැකි බව පවසන අතර එය අපූරු අවස්ථාවකි. මේ වග පැවසීමේ දී කවියා 'ල' හා 'ළ' භාවිත කරමින් රසවත් අනුප්‍රාසාත්මක යෙදුමක් යොදා ඇත්තේ " **නල බල සසල දළ රළ පෙළ"** යන යෙදුම මගිනි. ඉන් මතුවන කවියාගේ ප්‍රතිභාවය ගැන පවසන්නට තවත් අටුවා ටීකා අවැසි වේද?.

(ආ)

විවිධ රසයෙන් අනූන සැළලිහිණි සන්දේශයේ කාව්‍යෝපක්‍රම භාවිතය ඉතා විශිෂ්ටය. ඒ බව තහවුරු කිරීමේ දී නිදසුන් බොහෝමයක් නිර්මාණය පුරාවටම හමුවන අතර පහත දැක්වෙන්නේ ඉන් එක් අවස්ථාවකි.

"නිල තුරඟුට නැගෙමින් රිවි දෙව් සිරින
දුල කර සේසත් මිණි බරණ කිරණින
බල පිරිසෙන් සහ යාපා පටුන් ගෙන
බල සේනානායක සපු කුමරු එන"

කෝට්ටේ රාජධානිය යනු සැබවින් ම බලවත් වූ රාජධානියකි. එහි සේනාව මෙහෙයවමින් කටයුතු කළ සපුමල් කුමරු එක් අවස්ථාවක දී යාපා පටුන ජයගෙන ප්‍රීතියෙන් සේනාව සමගින් එන ආකාරය සැළලිහිණියාගේ නෙත ගැටෙයි. ඒ මොහොතේ කුමරුගේ දැකීම කවියා දක්වන්නේ සූර්ය දිව්‍ය රාජයා දිස් වූවා මෙන් සේයාවක් ප්‍රතීයමාන කරන බවයි. මෙකී අදහස දැක්වීම සඳහා **"නිල තුරඟුට නැගෙමින් රිවි දෙව් සිරින"** යන උපමා යෙදුමෙන් පසක් වන්නේ කවියාගේ ප්‍රතිභාවය යි. අප තේමාවට මෙය උචිත සාධකයකි.

දූත කාර්යයෙහි නියැලෙන සැළලිහිණියාට රමණීය වන පෙතක සුන්දරත්වය විඳීමට හැකි වෙයි. එය කෙතරම් සොඳුරු අවස්ථාවක් වූවා ද යන්න පහත පැදියෙන් ගම්‍යමාන වේ.

"වනසිරි පියුම් රා බැඳ රන බරණ යුරු
වටපිරි සුපුල් දුනුකේ මල් මුරුත තුරු
බිඟු පිරි වැරූ ඔලු පුලැඹුලවල තඹුරු
හිමසරි සිසිල් දිය හෙබ දැක යන් මිතුරු"

කාන්තාවකගේ සුන්දරත්වය තීව්‍ර වීමට රන් ආදී ආභරණවල රශ්මිය බෙහෙවින් බලපාන අතර ඉන් අපූරු සුන්දරත්වයක් මතු වේ. වන සිරිය නමැති ශ්‍රියා කාන්තාවගේ ද එවැනි ස්වභාවයක් මතු වන්නේ ජීවමාන කතට නොදෙවෙනි

ලෙසිනි. වනයෙහි දුනුකේ හා මුරුත ගස්වල පිපිණු මල්වල පැහැයෙන් ඒ බව වඩාත් තහවුරු කරන බව කවියා දක්වන්නේ රසවත් උපමා යෙදුමකින් සහෘද හදවත පූරණය කරමිනි. ඒ **"වනසිරි පියුම් රා බැඳ රන බරණ යුරු"** යන උපමාවාචී යෙදුම මගිනි. එයිනුදු පසක් වන්නේ කවියාගේ සුවිශේෂී ප්‍රතිභාපූර්ණත්වය යි.

මෙතෙක් සාකච්ඡාවට බඳුන් වූයේ සැළලිහිණි කතුවරයාගේ අපූරු වර්ණනා චාතුර්යයත් එමෙන් ම උචිත උපමා භාවිතයත් නිර්මාණය පුරාවට ම විහිදී පවතින බව යන්න යි. ඒ වග තහවුරු කර ගැනීමේ දී මේ දක්වා විශද කළ කරුණු නිසැක වශයෙන් ම සාක්ෂි සපයන වග අවිවාදිත ය.